පොදු චක්‍රලේඛ ලිපි අංක: 2631(I)

මගේ අංකය: 041/106(3)14/86අ
1986 ජූලි මස 28 දින, කොළඹ 2,
දේශීය ආදායම් ගොඩනැගිල්ලේ,
සෞඛ්‍ය අමාත්‍යාංශයේ දීය.

සියළුම විමධ්‍යගත කොට්ඨාශ ප්‍රධානීන් හා
ආයතන ප්‍රධානීන් වෙත.

## මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් සඳහා අමතර දීමනාවක් ගෙවීම.

අනුමත නිවාඩු ඇතුළුව, සතියකට දින 05 කට වැඩියෙන් රාජකාරි කරන රෝහල් හා විශේෂිත ව්‍යාපාර වල සේවාවේ නියැලී සිටින මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන්ටද 1986.07.01 දින සිට මෙහි පහත 2(I) හා 2(II) ඡේදයෙහි දක්වා ඇති පරිදි දීමනා ගෙවීමට තීරණය කර තිබේ.

02. (I). රාජකාරි කිරීමට අවශ්‍ය වන ඕනෑම සෙනසුරාදාවක් සඳහා එවැනි සෙනසුරාදාවක පළමුවන පැය 04 සඳහා නිලධාරියාගේ මාසික මූලික වැටුපෙන් 1/20 ක්ද, පැය 04 ට වඩා වැඩියෙන් රාජකාරි කරන කාලය සඳහා සාමාන්‍ය අතිකාල දීමනාවක්.

(II). ඉරිදා රාජකාරි කළහොත්, නිලධාරියාගේ මාසික මූලික වැටුපෙන් 1/20 ක ප්‍රමාණයක් හෝ අතිකාල දීමනාව හෝ යන දෙකින් වැඩි දීමනාවක්.

අතිරේක සෞඛ්‍ය ලේකම්,
සෞඛ්‍ය ලේකම් වෙනුවට.

පිටපත:- ලේකම්, වනිතා කටයුතු හා ශික්ෂණ රෝහල් අමාත්‍යාංශය - දැන ගැනීම සඳහා.

ගුත-/25.